# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2080/63 - 2018 ජූලි මස 20 වැනි සිකුරාදා - 2018.07.20

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### 1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනත

92 වැනි වගන්තිය යටතේ නියමය

1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනතේ 92 වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍ය, රවුෆ් හකීම් වන මම, එකී මණ්ඩලයට හෙම්මාතගම ජල සම්පාදන ක්‍රමයේ අඹදෙනියවත්ත, බටවල - නිව්ලැන්ඩ් කොටසින් ජල ගබඩා ටැංකිය හා ප්‍රවේශ මාර්ගය ඉදිකිරීම සඳහා ඉඩම් කොටසක අයිතිය අත්කර ගැනීම අවශ්‍යව ඇති හෙයින්, මෙහි පහත උපලේඛනයෙහි දැක්වෙන ඉඩම් කොටසේ නිශ්චල දේපළ අයිතිය අත්කර ගැනීම මෙම නියමයෙන් අනුමත කරමි.

රවුෆ් හකීම්,
නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍ය.

2018 ජූලි මස 17 වැනි දින,
අංක 35, ''ලක්දිය මැදුර''
නව පාර්ලිමේන්තු පාර, පැලවත්ත, බත්තරමුල්ල,
නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍යාංශයේ දී ය.
5/2/1/1404.

#### උපලේඛනය

කැගල්ල දිස්ත්‍රික්කයේ, මාවනැල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අලුත්නුවර, අංක 27 ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ, අලුත් නුවර ගමේ පිහිටි - නිව්ලැන්ඩ් වත්ත නමැති ඉඩමෙන් සම්පූර්ණ ප්‍රමාණයෙන් රූඩ් 01 ක් පමණ වන පහත සඳහන් මායිම් තුළ වූ ඉඩම් කොටස :

| | | |
|---|---|---|
| *උතුරට* | : | මෙම ඉඩමේ ඉතිරි කොටස ; |
| *නැගෙනහිරට* | : | මෙම ඉඩමේ ඉතිරි කොටස ; |
| *දකුණට* | : | එම ඉඩමේ ඉතිරි කොටස ; |
| *බටහිරට* | : | වතු පාර හා එම ඉඩමේ ඉතිරි කොටස. |

*ඉඩමට හිමිකම් කියන්නාගේ නම හා ලිපිනය* : 01. ප්‍රධාන විධායක නිලධාරී,
කැගල්ල වැවිලි සමාගම,
අඹදෙනිය වත්ත,
අරණායක.

08 - 255


1A - G 28135 — 40 (2018/07)



*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

**1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනත**

92 වැනි වගන්තිය යටතේ නියමය

1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනතේ 92 වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍ය, රවුෆ් හකීම් වන මම, එකී මණ්ඩලයට යෝජිත අලුත්ගම - බේරුවල අපජල බැහැර කිරීමේ ව්‍යාපෘතිය යටතේ අපජල පවිත්‍රාගාරයක් ඉදිකිරීම සඳහා ඉඩම් කොටසක් අයිතිය අත්කර ගැනීමට අවශ්‍ය වී ඇති හෙයින්, මෙහි පහත උපලේඛනයෙහි දැක්වෙන ඉඩම් කොටසේ නිශ්චල දේපළ අයිතිය අත්කර ගැනීම මෙම නියමයෙන් අනුමත කරමි.

රවුෆ් හකීම්,
නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍ය.

2018 ජූලි මස 17 වැනි දින,
අංක 35, ''ලක්දිය මැදුර''
නව පාර්ලිමේන්තු පාර, පැලවත්ත, බත්තරමුල්ල,
නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍යාංශයේ දී ය.
5/2/2/1406.

**උපලේඛනය**

කළුතර දිස්ත්‍රික්කයේ, බේරුවල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක : 758, හෙට්ටිමුල්ල ග්‍රාම නිලධාරී වසමේ හෙට්ටිමුල්ල ගමේ පිහිටි ප්‍රමාණයෙන් හෙක්ටයාර් 2.02 (අක්කර 5) ක් පමණ වූ නවසියාවත්ත නොහොත් නවසියවත්ත නැමති පහත සඳහන් මායිම් තුළ වූ ඉඩම් කොටස :

*උතුරට* : මෙම ඉඩමේ ඉතිරි කොටස ;
*නැගෙනහිරට* : නවසියාවත්ත පාර ;
*දකුණට* : සුදු ඇල ;
*බටහිරට* : හිමිකරුවකු නොදන්නා ඉඩම.

*ඉඩමට හිමිකම් කියන්නාගේ නම හා ලිපිනය* : 01. කේ. සුබසේන ද සිල්වා මහතා,
කන්දේ විහාර පාර,
කළුවාමෝදර,
අළුත්ගම.

08 - 256

---

**1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනත**

92 වැනි වගන්තිය යටතේ නියමය

1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනතේ 92 වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍ය, රවුෆ් හකීම් වන මම, එකී මණ්ඩලයට මාතර අපජල බැහැර කිරීමේ ව්‍යාපෘතිය යටතේ යෝජිත අපජල පවිත්‍රාගාරය ඉදිකිරීම සඳහා ඉඩම් කොටසක් අයිතිය අත්කර ගැනීමට අවශ්‍ය වී ඇති හෙයින්, මෙහි පහත උපලේඛනයෙහි දැක්වෙන ඉඩම් කොටසේ නිශ්චල දේපළ අයිතිය අත්කර ගැනීම මෙම නියමයෙන් අනුමත කරමි.

රවුෆ් හකීම්,
නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍ය.

2018 ජූලි මස 17 වැනි දින,
අංක 35, ''ලක්දිය මැදුර''
නව පාර්ලිමේන්තු පාර, පැලවත්ත, බත්තරමුල්ල,
නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍යාංශයේ දී ය.
5/2/2/1406.

**උපලේඛනය**

මාතර දිස්ත්‍රික්කයේ, මාතර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක : 420 A, හිත්තැටිය නැගෙනහිර ග්‍රාම නිලධාරි වසමේ හිත්තැටිය නැගෙනහිර ගමේ පිහිටි වේ කැටිය කුඹුර නැමති ඉඩමෙන් හෙක්ටයාර් 2.02 (අක්කර 5) ක් ප්‍රමාණයෙන් යුක්ත වූ පහත සඳහන් මායිම් තුළ වූ ඉඩම් කොටස :

*උතුරට* : මාතර - හක්මන පාරට වැටෙන අතුරු පාර ;
*නැගෙනහිරට* : එම ඉඩමේ ඉතිරි කොටස ;
*දකුණට* : එම ඉඩමේ ඉතිරි කොටස ;
*බටහිරට* : එම ඉඩමේ ඉතිරි කොටස.

*ඉඩමට හිමිකම් කියන්නන්ගේ නම් හා ලිපිනයන්* :

01. රුවන් ජයවර්ධන මය, තමරා ජයවර්ධන මිය, ප්‍රමිලා ජයවර්ධන මිය, කුමුදු සමරසිංහ මිය, 152, ඇලවේල්ල පාර, හිත්තැටිය නැගෙනහිර, මාතර.

02. ලලනි ශ්‍රියංගිකා විජේසේකර ජයවර්ධන මිය, ''ජයපති'', හිත්තැටිය නැගෙනහිර, මාතර.

08 - 257

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.